## සාරාංශය

සිසුන් පාසලේදී පෙන්වනු ලබන නුසුදුසු හැසිරීමක් සඳහා සිතාමතා ම දෙනු ලබන කායික හෝ මානසික රිදවීමක් පාසලේදී දඬුවම් කිරීමක් ලෙස සලකනු ලැබේ. නමුත් පාසල තුළ දී සිසුන්ට සිදුවන හිංසනය වැළැක්වීමේ අරමුණින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාසල තුළ දඬුවම් සීමා කිරීම සඳහා චක්‍රලේඛ ගණනාවක් නිකුත් කර ඇත. කෙසේ වුවත් තවමත් ගුරුවරු සහ අනෙකුත් පරිපාලන නිලධාරීහු සිසුන් සඳහා දඬුවම් භාවිතා කරති. විශේෂයෙන් නව යොවුන්වියේ සිසුන් හේතු ගණනාවක් සඳහා පාසල තුළ දී විවිධාකාර දඬුවම්වලට ලක්වෙති. එසේම මෙම නව යොවුන්වියේ සිසුන් පාසලේදී මුහුණදෙන දඬුවම්වල බලපෑම් පිළිබඳව විවිධ අදහස් නව යොවුන්වියේ සිසුන් තුළ සහ ගුරුවරුන් තුළ පවතී. එබැවින් වර්තමාන අධ්‍යයනය පාසලේදී නව යොවුන්වියේ සිසුන් මුහුණදෙන දඬුවම්වල බලපෑම් පිළිබඳව සොයාබැලීමට පර්යේෂකයා යොමුවිය.

ඉහත පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා අධ්‍යයනය අරමුණු පහකින් සමන්විත විය. පළමුවන අරමුණ වූයේ, පාසල තුළ නව යොවුන්වියේ සිසුන් මුහුණදෙන විවිධ දඬුවම් ස්වරූපයන් පිළිබඳව සොයාබැලීමයි. දෙවන අරමුණ වූයේ, පාසලේදී නව යොවුන්වියේ සිසුන් දඬුවමට ලක්වීමට නව යොවුන්වියේ සිසුන් කරන වැරදි චර්යාවන් පිළිබඳව සොයාබැලීමයි. තෙවන අරමුණ වූයේ, දඬුවම් පිළිබඳව ගුරු-සිසු සංජානනයන් පිළිබඳව සොයාබැලීමයි. හතරවන අරමුණ වූයේ, දඬුවම් නිසා නව යොවුන්වියේ පාසල් සිසුන්ට සිදුවන බලපෑම පිළිබඳව සොයාබැලීමයි. අවසාන වශයෙන් මෙම අධ්‍යයනයේදී පාසලේදී දඬුවම වෙනුවට ගත හැකි විකල්ප ක්‍රමවේද පිළිබඳව යෝජනා ඉදිරිපත් කර ඇත.

අධ්‍යයනයේ පර්යේෂණ පිරිසැලසුම වූයේ සමීක්ෂණ ක්‍රමවේදයයි. මෙම පර්යේෂණ අධ්‍යයනයේදී නියැදිය ලෙසින් මාතර අධ්‍යාපන කොට්ඨාසයේ ජාතික පාසල් දෙකක 10, 11ශ්‍රේණිවල ඉගෙනුම ලබන පාසලේදී දඬුවමට මුහුණදෙනු ලැබූ නව යොවුන්වියේ සිසුන් හතළිස්දෙනෙකු (40) 10 සහ 11ශ්‍රේණිවල පන්තිභාර ගුරුභවතුන් විසිදෙනෙකු (20) සහ එම පාසල්වල පාසල් උපදේශනයභාර ගුරුභවතුන් දෙදෙනෙකු (2) ගෙන් යුක්ත නියැදි ඒකක හැට දෙකක් (62) යොදා ගැණින. පන්තිභාර ගුරුභවතුන්ගෙන් සහ සිසුන්ගෙන් ප්‍රශ්නාවලිය භාවිතයෙන් තොරතුරු ලබා ගන්නා ලදි. එමෙන්ම තෝරාගත් පන්තිභාර ගුරුභවතුන් සහ පාසල් උපදේශනයභාර ගුරුභවතුන් සමග සම්මුඛ සාකච්ඡා මගින් තොරතුරු ලබා ගන්නා ලදි. ලබා ගන්නා ලද සියලු තොරතුරු ප්‍රමාණාත්මකව සහ ගුණාත්මකව දත්ත විශ්ලේෂණය කරන ලදි. එහිදී ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය වගු සහ

රූප සටහන් මගින් සිදු කරන ලදි. ගුණාත්මකව දත්ත විශ්ලේෂණය සන්ධාර විශ්ලේෂණය යටතේ සිදු කරන ලදි.

වත්මන් පර්යේෂණ අධ්‍යයනය මගින් පාසලේදී නව යොවුන් සිසුන් විවිධාකාරයේ දඬුවම් ස්වරූප රාශියකට මුහුණදෙනු ලබන බව අනාවරණය වූ අතර දණ ගස්වා තැබීම, බැණ වැදීම සහ පහරදීම ඉන් ප්‍රධාන දඬුවම් ස්වරූප ලෙසින් අනාවරණය විය. ගුරුවරුන්ට අගෞරව වන ලෙසින් නව යොවුන් සිසුන් කතා කිරීම, ජංගම දුරකථන සිසුන් පාසලට රැගෙන ඒම, කොණ්ඩය සම්බන්ධ විලාසිතා ආදි නොගැළපෙන චර්යාවන් නව යොවුන් සිසුන් දඬුවම් ලැබීමට සිදු කරන වැරදි චර්යාවන් ලෙසින් අනාවරණය විය. නව යොවුන් සිසුන් තුළ කායික පීඩාවන් ඇතිවීම, මානසික පීඩාවන්ට ලක්වීම, අධ්‍යාපනික මට්ටම පහළ බැසීම, නව යොවුන් සිසුන්ගේ කළහකාරී හැසිරීම සහ විනාශකාරී හැසිරීම වැඩිවීම, මිලේච්ඡතාව ඇතිවීම, අවධානය හීනවීම, පාසලෙන් ගිලිහෙන සංඛ්‍යාව වැඩිවීම, සිසුන් පාසල මග හැරීම, පාසල් භීතිකාව ඇතිවීම, ආත්ම අභිමානය අඩුවීම, කාංසාව ඇතිවීම, විශාදයට ගොදුරුවීම, සියදිවි නසා ගැනීම, ගුරුවරුන් කෙරෙහි ද්වේශ සහගතව බැලීම සහ චිත්තවේගී දුර්වල සිසුන් බිහිවීම දඬුවමෙන් නව යොවුන් සිසුන්ට සිදුවන බලපෑම් ලෙසින් අනාවරණය විය. පාසල්වල විනය පවත්වා ගැනීම සඳහා දඬුවම වැදගත් වුවත් ශාරීරික දඬුවම් භාවිතයට වඩා අපේක්ෂිත හැසිරීම් දෙසට සිසුන් වෙනස් කිරීම සඳහා විකල්ප ක්‍රමවේද ගුරුවරුන් භාවිතා කිරීම වඩා සුදුසු ය. ගුරුවරුන් විසින් සිසුන්ට හොඳ ආදර්ශයක් සැපයීම, පාසල විසින් සිසුන්ගෙන් අපේක්ෂිත හැසිරීම පැවසීම, සිසුන්ට ප්‍රශංසා කිරීම, පාසලතුළ සුදුසු හැසිරීම් පිළිබඳව සිසුහු දැනුවත් කර තිබීම, ශිෂ්‍ය මාර්ගෝපදේශනය පාසල තුළ ක්‍රියාත්මක කිරීම, ගුරුවරුන් විසින් නිර්මාණාත්මක ඉගැන්වීම් ක්‍රම භාවිතය, නිර්මාණාත්මක පන්ති කාමර පරිසරය සැකසීම, සිසුන්ට ඔවුන්ගේ කුසලතා පෙන්වීමට විවිධ අවස්ථා ලබාදීම සහ අමතර වැඩ ලබාදීම වැනි විකල්ප ක්‍රමවේද මෙහිදී අනාවරණය විය. මෙම අධ්‍යයනය මගින් පර්යේෂකයා පෙන්වා දෙනු ලබන්නේ ස්වයංව ම සංවරය වන සිසුන් බිහි කිරීමට ගුරුවරුන් වග බලා ගත යුතු අතර නව යොවුන්වියේ සිසුන්ට දඬුවම වෙනුවට විකල්ප ක්‍රමවේද පාසල තුළ භාවිතා කිරීම වඩාත් උචිත බව යි.

# ABSTRACT

Punishments refers to inflicting deliberate physical and emotional pain in response to undesired behaviour by students in schools. But the violence towards children in schools is no longer acceptable. Therefore the Ministry of Education has issued number of circulers to limit the punishments in schools. However, the teachers and other administrative officers still use punishments for students. Specially the adolescent students face different types of punishments in schools for number of reasons. There are many debates among teachers and adolescent students about the punishments faced by the adolescent students. Therefore, this study focuses on the effects of punishments faced by adolescent students at schools.

To achieve the aim of the study five objectives were formed. The first objective was aimed to find out the types of punishments faced by adolescent students at schools. Second objective was to find out the inappropriate behaviours done by adolescent students in order to gain the punishments. Thirdly the researcher investigative the perceptions of both teachers and students about the punishments. As the fourth objective the study aimed to find out the effects of punishments on students. Finally, the study present suggestions on alternative methods that can be used instead of punishments.

The design of the study was the survey method. Forty (40) adolescent students from grade 10 and 11, twenty (20) class teachers and two (2) school counsellors from two schools in Matara Educational division were the sample of the study. Questionnaires were administered to teachers and students. Interviews were conducted for selected class teachers and school counsellors. Quantitative data were analysed by using tables and graphs. Qualitative data were analysed by content analysis. Findings of the study revealed that scolding, kneeling down in class, hitting and caning with a stick are the most frequently used among varieties of school punishment. Aggressive and destructive behaviour problems such as talking to teachers in a way of

insulting them, using inappropriate languages, talking mobile phones to in schools and wearing having various kinds of hair cuttings and hair styles were the possible reasons for persistence of punishment. It also revealed that punishment leads to adverse physical, psychological and educational problems including increased aggressive and destructive behaviour in the classroom, vandalism, poor school achievement, poor attention span, increased dropout rate, school avoidance and school phobia, low self-esteem, anxiety, depression, suicide and retaliation against from teachers. Perceptions of the teachers and students show emphasised that although the punishments are important to maintain the discipline in schools, but alternative methods are better in changing students towards expected behaviours than the use of physical punishments. Setting a good example to students, telling what is expected, praising and motivating towards appropriate behaviour, provide guidance and counseling, use of creative teaching methods and setting creative classroom environments, giving various opportunities to students to use their skills, give extra work to students were suggested as alternative methods. Based on the findings, this study suggest that it is better to adopt alternative methods of punishment for undesired behaviour of adolescent students because of these alternative methods teachers can inculcate self-discipline among them.